RG/NB/01/04

2889488
2889489

2889491

rgd@sltnet.lk
rg@rgd.gov.lk

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgd.gov.lk

දිනය / திகதி / Date: 2012.12.26

**චක්‍රලේඛ** අංක 10/2012

**සියළුම ඉඩම්** රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

2013 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම.

ලේඛන ලියාපදිංචි කිරීම සහ ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම.

දැනට ක්‍රියාත්මක වන ලේඛන ලියාපදිංචි කිරීමේ හා ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ ගාස්තු 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇති බව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක FP/06/60/01/01 සහ 2012.12.20 දින දරණ ලිපිය මගින් මා වෙත දන්වා ඇත. ඒ අනුව අදාල ගාස්තු මුදලින් අය කර ගැනීමට පියවර ගන්න.

- ලියාපදිංචි කිරීමේ ගාස්තු

| | කාරණය | මුදල (රු.) |
|---|---|---|
| (I) | දැනට අය කරනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තුවට අමතරව ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතට අනුව ලියාපදිංචි කිරීම සඳහා භාර ගනු ලබන සෑම ලියවිල්ලක් සඳහාම | 100.00 |
| (II) | වසර දෙකක් හෝ ඊට අඩු කාල සීමාවක් සඳහා කේවියට තහනමක් ලියාපදිංචි කිරීම | 2,500.00 |
| (III) | ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්ක එකකට හෝ වැඩි ගණනක අදාල ඔප්පුවක් ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම | 1,000.00 |

- පරීක්ෂා කිරීමේ සහ උධෘත පිටපත් නිකුත් කිරීමේ ගාස්තු

| | කාරණය | මුදල (රු.) |
|---|---|---|
| (I) | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩම් ලේඛනයක්, සූචියක් හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කිරීම - එක් ඉඩමකට අදාලව | 500.00 |
| (II) | ඉඩම් ලේඛන උධෘත නිකුත් කිරීම - එක් ඉඩමකට අදාලව | 500.00 |
| (III) | ඔප්පුවක සහතික පිටපතක් නිකුත්කිරීම | 500.00 |

.......2

ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ ගාස්තු

| කාරණය | මුදල (රු.) |
|---|---|
| (I) ඇටෝර්නි බලපත්‍රයක් ලියාපදිංචි කිරීම | 1,500.00 |
| (II) ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම | 1,500.00 |
| (III) ඇටෝර්නි බලපත්‍ර හෝ ලියාපදිංචි කිරීමේ සටහන් පරීක්ෂා කිරීම | 500.00 |
| (IV) ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක සහතික පිටපතක් නිකුත් කිරීම | 500.00 |
| (V) ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක සහතික කරන ලද උධෘත පිටපතක් නිකුත් කිරීම | 500.00 |

03. ඒ ඒ කරුණු සම්බන්ධයෙන් අය කරනු ලබන මුදල් ගිණුම් ගත කිරීම පිළිබඳ විස්තර දෙපාර්තමේන්තු චක්‍රලේඛ 11/2012 මගින් ඔබ වෙත එවා ඇත.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත : 1. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, - ඔබේ අංක. FP/06/60/01/01 සහ 2012.12.20 දිනැති ලිපිය අනුව දැන ගැනීම සඳහා

2. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා

3. විගණකාධිපති - දැන ගැනීම සඳහා

4. ප්‍රධාන ගණකාධිකාරී - මුදල් ගිණුම් ගත කිරීම පිළිබඳ විස්තර සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ට කඩිනමින් යැවීම සඳහා

5. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර්වරුන් - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා